ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

## ආචාර්ය එස්. ජයිශංකර් මහතා සහ ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන විශාල ඉන්දීය මූල්‍ය ආධාරය පිළිබඳ අවසන් එකඟතාවයකට පැමිණේ

විදේශ කටයුතු අමාත්‍ය ආචාර්ය එස්. ජයිශංකර් මහතා 2022 ජනවාරි 15 වන දින ශ්‍රී ලංකා මුදල් අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මහතා සමඟ අන්තර්ජාලය ඔස්සේ සාකච්ඡාවක නිරත විය. පසුගිය මාසයේදී රාජපක්ෂ මහතා සිදුකළ ඉන්දීය සංචාර යෙන් අනතුරුව මෙම අතත්‍ය හමුව පැවැත්විණ.

2. විදේශ අමාත්‍යතුමා තමන් වෙනුවෙන් සහ ඉන්දීය රජය සහ ජනතාව වෙනුවෙන් 2022 නව වසර සඳහා සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව විසින් සමරනු ලබන තෛ පොංගල් උත්සවය සඳහා ශ්‍රී ලංකා මුදල් අමාත්‍යතුමාට, රජයට සහ ජනතාවට සිය සුභාශිංශන පිරිනැමීය.

3. ඉන්දියාව සෑමවිටම ශ්‍රී ලංකාව සමඟ රැඳී සිට ඇති බව සිහිපත් කළ ආචාර්ය ජයිශංකර් මහතා කොවිඩ්-19 වසංගතය විසින් මතු කර ඇති ආර්ථික සහ වෙනත් අභියෝගයන් ජයගැනීම සඳහා හැකි සියලු අයුරින් ඉන්දියාව ඉදිරියටත් ශ්‍රී ලංකාවට සහය ලබා දෙන බව ප්‍රකාශ කළේය. සමීප මිතුරන් සහ සමුද්‍රීය අසල්වැසියන් වශයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල් ද්විත්වයටම සමීප ආර්ථික සබඳතාවන්ගෙන් ප්‍රතිලාභ හිමිකර ගත හැකිය.

4. SAARC විනිමය හුවමාරු පහසුකම යටතේ ශ්‍රී ලංකාවට ලබාදුන් ඇමරිකානු ඩොලර් මිලියන 400ක මුදල සහ ආසියානු නිෂ්කාෂණ සංගමයට ගෙවිය යුතු ඇමරිකානු ඩොලර් මිලියන 515.2ක මුදල මාස දෙකකින් කල් දැමීම ශ්‍රී ලංකාවට සහනයක් වනු ඇති බව අමාත්‍යවරුන් දෙපළ සඳහන් කළහ.

5. ආහාර, අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ ඖෂධ ආනයනය සඳහා ඇමරිකානු ඩොලර් බිලියන 1ක සහ ඉන්දියාවෙන් ඉන්ධන ආනයනය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 500ක ණය පහසුකමක් ලබාදීමේ ප්‍රගතිය අමාත්‍යවරුන් දෙපළ විසින් මෙහිදී සමාලෝචනය කරන ලදී.

6. රාජපක්ෂ මහතා ඉන්දියාව විසින් දිගු කලක සිට ශ්‍රී ලංකාවට ලබාදෙන සහයෝගීතාවය මෙහිදී සිහිපත් කළ අතර එම උපකාරයන් දැඩිව අගය කළේය. එතුමා ශ්‍රී ලංකාවේ වරාය, යටිතල පහසුකම්, බලශක්තිය, පුනර්ජනනීය බලශක්තිය, විදුලිබලය සහ නිෂ්පාදන ක්ෂේත්‍රයන් ඇතුළු වැදගත් අංශයන් රැසක ඉන්දීය ආයෝජන සාදරයෙන් පිළිගත් අතර එවන් අයෝජන දිරිමත් කිරීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරන බවට සහතික විය. මෙම සන්දර්භය තුළ ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ඒකාබද්ධව නවීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් මෑතකදී ගන්නා ලද පියවර ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාවය ඉහළ නැංවීමට මෙන්ම ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීමට ද හේතුවනු ඇති බව අමාත්‍යවරුන් දෙපළ විසින් පෙන්වා දෙන ලදී.

7. විදේශ අමාත්‍යතුමා ශ්‍රී ලංකාව භාරයේ සිටින ඉන්දීය ධීවරයන්ගේ ගැටළුව ද මෙහිදී මතු කළ අතර මානුෂික කරුණු මත එම ධීවරයන් කඩිනමින් නිදහස් කරන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේය.

8. දෙරටෙහිම ප්‍රගතිය සහ සෞභාග්‍යය වෙනුවෙන් දිගුකාලීන ආර්ථික සහයෝගීතාවය සඳහා අන්‍යෝන්‍ය වශයෙන් වාසිදයි

ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගීතාවයට මඟ පෙන්වීම සඳහා සමීපව කටයුතු කිරීමට අමාත්‍යවරුන් දෙපළ මෙහිදී එක ඟ වූහ.

(මෙම පුවත්පත් නිවේදනයේ අන්තර්ගතය නව දිල්ලියේ විදේශ කටයුතු ආමාත්‍යාංශය විසින් 2022 ජනවාරි 15 වන දින නිකුත් කරන ලද පුවත්පත් නිවේදනයක් ඇසුරින් සකස් කරන ලදී)

***

කොළඹ
2022 ජනවාරි 16